
# ශ්‍රී ලංකාවේ විල්ලු තෘණ බිම් පරිසර පද්ධතිය

**ආර්. ඒ ධනුෂ්කා රණවීර**
සහකාර කථිකාචාර්ය,
භූගෝල විද්‍යා අධ්‍යයන අංශය,
කැළණිය විශ්වවිද්‍යාලය.
ukdhanu@yahoo.com

ස්වාභාවික උරුම තහවුරු කිරීමට පරිසර පද්ධතිවල දායකත්වය අතිමහත්ය. පොළොන්නරුවේ ස්වාභාවික උරුමය කියාපාන අනන්‍යතාවය ලෙස මහවැලි ගංගාව පිටාර ගැලීමෙන් අනතුරුව ගංගා ද්‍රෝණි දෙපස අවපාත තුළ ජලය රැස්වීමෙන් නිර්මාණය වන්නා වූ අපූර්වතම පරිසරය හඳුන්වාදිය හැකිය. එම පරිසර පද්ධතිය විල්ලු තෘණ බිම් ලෙස හැඳින්වේ. ගංගාවක ඉවුරු බිඳී පිටාර ගලන විට දෙපස පහත් බිම් ප්‍රදේශවල පාෂාණ සහ මඩ තට්ටු තැම්පත්වේ. පිටාර තැන්නේ පත්ල මෙසේ නිර්මාණය වන අතර බොහෝ අවසාදිත තට්ටුව ජල මාර්ගයේ පත්ලේ මට්ටමටත් යටට විහිදෙන අතර එහි පාංශු සංයුතිය මත විල්ලුවේ ජලය පවිත්‍ර කරන වැදගත් ජලධරයක් ලෙස ද හඳුනාගත හැකිය. එම පාංශු කලාපවල ජලය සංතෘප්ත වූ විට ජලජ සහ භෞමික ජීවීන්ට ක්ෂේම භූමියක් ලෙස ද ක්‍රියා කරයි. පහත රූප සටහන් තුළින් විල්ලු පරිසර පද්ධතියක හරස්කඩක් දැක්වෙයි.

රූපසටහන් අංක 01 විල්ලු පරිසර පද්ධතියක හරස්කඩ





ශ්‍රී ලංකාවේ මහවැලි ගංගාව ආශ්‍රිතව විල්ලු 38 ක් දැකිය හැකි අතර වැඩි විල්ලු පරිසර පද්ධති සංඛ්‍යාවක් පොළොන්නරුවේ දැකිය හැකිවේ. ශ්‍රී ලංකාවේ විශාලතම විල්ලුව ලෙස පොළොන්නරුවේ පිහිටා ඇති හඳපාන් විල්ලුව හඳුන්වා දිය හැකිය. ඡායා රූප අංක 1 මඟින් හඳපාන් විල්ලුව දැක්වේ. ශ්‍රී ලංකාවේ විශාලත්වය අනුව හඳුනාගනු ලැබූ ප්‍රධාන විල්ලු අතර කරපොළ විල්ලුව සහ මුතුගල විල්ලුව හඳුන්වාදිය හැකි අතර මෙම විල්ලු පොළොන්නරුවේ පිහිටා තිබීම සුවිශේෂ වේ. මේ අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන විල්ලු 06 ක් ව්‍යාප්ත වී පවතී.

එනම්:
- හඳපාන්විල
- බැඳියාවිල
- කරපොල
- මුතුගල
- කටුවන්විල
- මනම්පිටිය වශයෙනි.

පහත සිතියම් අංක 1 මගින් පොළොන්නරු දිස්ත්‍රික්කයේ ප්‍රධාන විල්ලුවල ව්‍යාප්තිය දැක්වේ. හඳපාන් විල්ලුව සහ බැඳියා විල්ලුව එකිනෙකට සම්බන්ධ වී පවතී. මෙම විල්ලුව හෙක්ටයාර 796 ක් පුරා පැතිරී ඇති අතර වසර පුරාම ජලය ස්ථිරවම රඳා පවතී. කරපොළ විල්ලුව දෙවනුවට විශාල වන අතර හෙක්ටයාර 552 ක් පුරා පැතිරී ඇති අතර සාමාන්‍යයෙන් ජලය ස්ථිරව රඳා පවතී. තෙවනුවට විශාල විල්ලුව වන්නේ මුතුගල විල්ලුවයි. එය හෙක්ටයාර 453 ක පැතිරී ඇති අතර ඉතාම කලාතුරකින් ජලය සිඳී යයි. කටුවන්විල විල්ලුව සහ මනම්පිටිය විල්ලුව කුඩා භූමි ප්‍රදේශයක පැතිරී පවතින අතර වර්ෂාපතන ඍතු සමඟ ජල ස්කන්ධ වෙනස් වේ.

සිතියම් අංක 1 පොළොන්නරු දිස්ත්‍රික්කයේ ප්‍රධාන විල්ලුවල ව්‍යාප්තිය




ඡායාරූප අංක 1 හඳපාන් විල්ලුව



අවුරුද්දේ කෙටි කාලයක් තුළ ලැබෙන වර්ෂාපතනයෙන් ද, අවුරුද්ද පුරා පැවති අධික උෂ්ණත්වයෙන් ද අනෙක් පරිසර පද්ධතිවලට සාපේක්ෂව වෙනස්වේ. තවද අධික උෂ්ණත්වය පතිත වීම හේතුවෙන් නියඟයට ඔරොත්තු දෙන ශාක විශේෂ මෙහි බහුලව පවතී. එසේම පක්ෂි විශේෂ දක්නට ලැබෙන අතර ඉතාම දුර්ලභ කොකුන් මෙම පරිසර පද්ධතිවල ජීවත් වේ. පාදිලි කොකා සහ ඉතා අලංකාර පක්ෂියෙකු වන ලතු වැකියා සහ විවර තුඩුවා ද මෙහි දැකිය හැකිවේ.

එසේම මත්ස්‍යයින්ට විල්ලු පරාදීසයක් වැනිය. මේවායේ මත්ස්‍ය ගහනය ඉතා ඉහළය. ලූලා, ඉරි අංගුට්ටා, කොරියා, දං කොළ සාලයා, හුංගා, ඉස්සා, තෙලියා සහ මගුරා බහුලවම දැකිය හැකි අතර විල්ලු,

මත්ස්‍යයින්ට පමණක් නොව උභය ජීවීන්ට ද, උරගයිනට ද වාසස්ථාන සපයයි. හැල කිඹුල්ලු බහුලව දක්නට ලැබෙන අතර දියබරියන් සහ මැඩියන් විශේෂ ද දක්නට ලැබේ. එසේම පොළොන්නරුවේ විල්ලු වර්ණවත් වීම සඳහා අලි ඇතුන්ගේ ගහනය ද බලපානු ලැබේ. අලි ඇත්තු ද විල්ලු මඟින් පෝෂණය වෙති.

විල්ලු ආශ්‍රිත වෘක්ෂලතා ගත් විට කුඩා තෘණ විශේෂ, පන් වර්ග, වේවැල් වැනි අකාෂ්ඨීය ශාක වලින් සමන්විත වන අතර බක් මී, කුඹුක්, අඩම්බු, හැලඹ, පලු සහ වීර යන කාෂ්ඨීය ශාකවලින් සහ ඕලු, නෙළුම් පෙද, පාසි යන ජලජ ශාක විශේෂ සහ ජපන් ජබර යන ආක්‍රමණශීලී ශාකවලින් විල්ලු නිර්මාණය වී ඇත. ඡායාරූප අංක 2 මඟින් විල්ලු පරිසර පද්ධතියේ මත්ස්‍යයින් දැක්වේ.

ඡායාරූප අංක 2 විල්ලු පරිසර පද්ධතියේ මත්ස්‍යයින්




ඉහළ ජෛව විවිධත්වයකින් අනූන විල්ලු පරිසර පද්ධතිය, ඒ අවට වාසය කරන්නා වූ ජනතාව සඳහා අමිල සේවයක් ලැබේ. විල්ලු ආශ්‍රිතව ව්‍යාප්ත වී ඇති කුඹුරු අස්වැද්දීමට අවශ්‍ය ජලය විල්ලු විසින් සපයනු ලැබේ. එසේම සත්ත්ව පාලනය සඳහා එනම් කිරි ගවයන් සඳහා, එළුවන් සඳහා අවශ්‍ය තෘණ සහ ජලය විල්ලු මඟින් සපයනු ලැබේ. තවද මිරිදිය ධීවර කර්මාන්තය, වේවැල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා අවශ්‍ය සම්පත් මේ තුළින් ලබාගනු ලැබේ. සමහර විල්ලුවල ගඩොල් කර්මාන්ත සහ වැලි ගොඩ දැමීම යන ක්‍රියාවන්වලද නිරතවීමක් දක්නට ලැබේ. ගඩොල් කර්මාන්තය, වැලි ගොඩ දැමීම සහ විල්ලුව තුළ කරනු ලබන වගා කටයුතු නිසා විල්ලු පරිසර පද්ධතිවල ස්වභාවික ක්‍රියාකාරිත්වයන් අඩපණ වීමත් සමඟ පොළොන්නරුවේ අනන්‍යතාවය වියැකී යා හැකිය.

ආශ්‍රිත ගන්ත නාමාවලිය


An Environmental Profile of the Polonnaruwa District, (1993), Central Environmental Authority Ministry of Environment & Paliamentary Affairs.

Wetland Site Report Hadapan & Bendiy Villus, Wetland Conservation Project-Sri Lanka, Central Environmental Authority/Euro consults.

ගුණතිලක, ගල්ගේපිටිය, (1994), මිහිකත

**විවර තුඩුවා**
Asian Openbill
*Anastomus oscitans*

ශ්‍රී ලංකා වලිකුකුළා
Sri Lanka Junglefowl
*Gallus lafayetii*
(ශ්‍රී ලංකාවට ආවේණිකයි)





ශ්‍රී ලංකා පිළිලිච්චා
Sri Lanka
White - Throated Flowerpecker
*Dicaeum vincens*
(ශ්‍රී ලංකාවට ආවේණිකයි)